සියලුම හිමිකම් ඇවිරිණි/All Rights Reserved/முழுப் பதிப்புரிமையுடையது

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

**දෙවන වාර ඇගයීම - 2024**
**Second Term Evaluation - 2024**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය Grade | 06 | විෂයය Subject | ගණිතය |
| පත්‍රය *I* සහ *II* | | කාලය Time | පැය 02 |

නම/NAME:-..........................................................................විභාග අංකය/Index No. ...........................

- *I* කොටසේ ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න .
- සෑම ප්‍රශ්නයකටම ලකුණු 02 බැගින් හිමිවේ.
- 6 ශ්‍රේණියේ ගණිතය *I* හා *II* ප්‍රශ්නපත්‍රය පිටු 6 කින් සමන්විත වේ.

## <u>I කොටස</u>

(1) අන්තර්ජාතික සම්මත ආකාරයට දිනය ලියා ඇත්තේ, පහත කවර අවස්ථාවේ දැයි තෝරා පිළිතුර යටින් ඉරක් අඳින්න.

a) 96 – 03 – 17 b) 1996 – 3 – 17 c) 1996 - 03 – 17

(2) පහත ප්‍රකාශ නිවැරදි නම් "√" ලකුණද , වැරදි නම් "×" ලකුණද ප්‍රතිචාර කොටුව තුළ දක්වන්න.




| | ප්‍රකාශය | ප්‍රතිචාරය |
|---|---|---|
| i | P ලක්ෂය වෘත්තය මතද T ලක්ෂය වෘත්තයෙන් පිටත ද පිහිටා ඇත. | |
| ii | M ලක්ෂය වෘත්තය මතද T ලක්ෂය වෘත්තයෙන් පිටත ද පිහිටා ඇත. | |

(3) හිස්තැනට උචිත අගයන් ලියන්න.

i. ............. $\times$ 1000 = 37 000 ii. 49 000 $\div$ ............. = 490

(4) සංඛ්‍යාවක් ආසන්න දහයේ ගුණාකාරයට වැටයූ විට, 140 කි. එම සංඛ්‍යාව සඳහා වියහැකි,

i. උපරිම අගය කීයද ?

ii. අවම අගය කීයද ?

(5) $\frac{3}{100}$ යන භාග සංඛ්‍යාව, දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.



CamScanner

(6)




A හි සිට බලන විට හිස්තැනට උචිත දිශා දෙක ලියන්න.

(7) 18 හා 28 අතර පිහිටි ප්‍රථමක සංඛ්‍යා සියල්ල ලියන්න.

(8) ''එකසිය තිස් අට බිලියන දෙසිය දහස් විසි හතර'' මෙම සංඛ්‍යාව ඉලක්කමෙන් ලියා දක්වන්න.

(9)




මෙහි දක්වා ඇති දෑ පැහැදිලිව කොටස් දෙකකට වෙන්කර කොටුව තුළ ලියා දක්වන්න.

(10) පස්වන සමචතුරස්‍ර සංඛ්‍යාව පහත රූපයේ පරිදි දැක්විය හැකිය.



මේ පරිදි සැකසූ විට දොළොස්වන සමචතුරස්‍ර සංඛ්‍යාව කුමක්ද ?

(11) 30078 m යන්න km හා m වලින් දක්වන්න.

.................... km ............m

(12) $9l$ $125ml$ තිබූ තෙල් ප්‍රමාණයකින් $4l$ $500ml$ වැය විය. ඉතිරි තෙල් ප්‍රමාණය කොපමණ ද?



CamScanner

(13) එක්තරා ඝනවස්තුවක සියළුම මුහුණත් සෘජුකෝණාස්‍රාකාර වේ. එම ඝනවස්තුවේ ශීර්ෂ 8 කි.

i. මෙම ඝන වස්තුවේ නම කුමක්ද ?

ii. එම ඝන වස්තුවයට ඇති දාර ගණන කීයද ?

(14) 5306 ÷ 13 හි , ලබ්ධිය = ..........................................

ශේෂය = .......................................... වේ.

```
    408
13| 5306
  | 52
     106
     104
       2
```

(15) පෙ.ව. 9 .45 ට නිවසින් පිට වූ සුගත් අපසු නිවසට පැමිණියේ ප.ව. 7.10 නම් නිවසින් බැහැරව සිටි කාලය සොයන්න.

(16) පියල් ළඟ රුපියල් 853 ක්ද, කමල් ලඟ රුපියල් 571 ක්ද, ඇත. දෙදෙනා ලග ඇති මුදල් ප්‍රමාණ සමානවීමට, පියල් කමල්ට ලබාදිය යුතු මුදල කීයද ?

(17)

□ × □ = 16

□ × ○ = 28

○ × △ = 63

□ + ○ + △ හි අගය සොයන්න.

(18) $\frac{7}{9} - \frac{\square}{3} = \frac{1}{\square}$ හිස්තැනට උචිත අගයන් ලියන්න.

(19) පළල 12 cm ක්වූ සෘජුකෝණාස්‍රයක පරිමිතිය 70 cm වේ. සෘජුකෝණාස්‍රයේ දිග සොයන්න.

(20) පොතක මිල රුපියල් 210 කි. පෑනක මිල රුපියල් 35 කි. පොත් 4 ක් පෑන් 3 ක් මිලට ගෙන රුපියල් 1000 නෝට්ටුව දුන්පසු, ඉතිරි මුදල ලෙස කීයක් ලැබේද ?



CamScanner

## *II* කොටස

- පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න හතරකටත් පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයේ නිවැරදි පිළිතුරු සියල්ල සඳහා මුළු ලකුණු 16 ක්ද, ඉතිරි ප්‍රශ්නවල නිවැරදි පිළිතුරු සියල්ල සඳහා මුළු ලකුණු 11 බැගින් ද හිමි වේ.
- නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලැබෙන අකාරය ප්‍රශ්නය ඉදිරියෙන් දක්වා ඇත.

(1) ‘‘භාග’’ පාඩමේ දී සාකච්ඡා කරන ලද විෂය කරුණු, සිද්ධාන්ත හා ක්‍රියාකාරකම් ගැන මතක සිහියට නගාගන්න.

(i)  රූපයේ පාට කර ඇති ප්‍රමාණය මුළු රූපයෙන් කවර භාගයක් ද? (ලකුණු1)

(ii) $\frac{3}{4}$ නිරූපණය කිරීමට රූප සටහනක් අඳින්න. (ලකුණු 1)

(iii) $\frac{4}{11}$ යනු $\frac{1}{11}$ ඒවා කොපමණ ප්‍රමාණයක් ද? (ලකුණු 1)

(iv) ලවය 5 ක්වූ නියම භාගයක් ලියන්න. (ලකුණු 1)

(v) $\frac{5}{10}$ ට තුල්‍ය භාග 2 ක් ලියන්න. (ලකුණු 2)

(vi) අ) $\frac{1}{9},\frac{1}{7},\frac{1}{10}$ ආ) $\frac{5}{9},\frac{5}{11},\frac{5}{7}$ ඇ) $\frac{5}{6},\frac{7}{12},\frac{3}{4}$ (ලකුණු 6)
ආරෝහණ පටිපාටියට සකස් කරන්න.

(vii) අගය සොයන්න. අ) $\frac{3}{5}-\frac{7}{15}$ ආ) $\frac{1}{4}+\frac{1}{6}+\frac{5}{12}$ (ලකුණු 4)

(2)

a) සුළු කරන්න.

i. $9\,000 - 5306$ (ලකුණු 1)
ii. $540 \times 10$ (ලකුණු 1)
iii. $3023 \times 24$ (ලකුණු 2)
iv. $5984 \div 11$ (ලකුණු 2)

b) 360087594027 යන සංඛ්‍යාව ,
i. කලාප වලට වෙන්කර ලියන්න. (ලකුණු 1)
ii. එම සංඛ්‍යාව කියවන ආකාරය ලියන්න. (ලකුණු 2)
iii. ඉහත සංඛ්‍යාවේ 9 න් නිරූපණය කරන අගය කීයද ? (ලකුණු 2)

(3) සරල රේඛීය තල රූප පහක් භාවිතකර, 6 ශ්‍රේණියේ දරුවෙක් සකස් කළ රූපයක් පහත දැක්වේ.








CamScanner

i. ඉංග්‍රීසි A,B,C,D,E අක්ෂරවලින් දක්වා ඇති තලරූප නම් කරන්න. (ලකුණු 5)

ii. නම් කරන ලද B හා E තලරූප දෙකෙහි,පොදුවේ දක්නට ලැබෙන,

අ) සමාන ලක්ෂණයක් ලියන්න. (ලකුණු 1)

ආ) අසමාන ලක්ෂණයක් ලියන්න. (ලකුණු 2)

iii. පහත රූප සටහන්වල පරිමිතිය 30 cm කි. ඒවායේ පාද එකිනෙකට දිගින් සමානය.එක් එක් තලරූපයේ පාදයක දිග සොයන්න.


(ලකුණු 1)


(ලකුණු 2)

(4)

i. නිවැරදිව අඳින ලද සංඛ්‍යා රේඛාවක ලක්ෂණ 02 ක් ලියන්න. (ලකුණු 2)

ii. -3 හා 3 අතර ඇති නිඛිල සියල්ල ලියන්න. (ලකුණු 2)

iii.




සංඛ්‍යා රේඛාවේ A, B , C, D මඟින් නිරූපණය වන සංඛ්‍යා ලියන්න. (ලකුණු 2)

iv. හිස් කොටුව තුළ "√" හෝ "×" ලකුණ යොදන්න.

අ) -15 > 2 ......... (ලකුණු 1)

ආ) −13 < −2 ........ (ලකුණු 1)

v. -3 , 0, 5, -4 යන සංඛ්‍යා සියල්ල ">" අසමානතා ලකුණ යොදා ගනිමින් පිළිවෙලට ලියා දක්වන්න. (ලකුණු 3)

(5) ඔත්තේ , ඉරට්ට , සමචතුරස්‍ර, ප්‍රථමක , ත්‍රිකෝණ , සංයුක්ත සංඛ්‍යා යනුවෙන් සංඛ්‍යා වර්ග රැසකි.

i. 50 ට පෙර ඇති විශාලතම ඔත්තේ සංඛ්‍යාව කුමක්ද ? (ලකුණු 1)

ii. 63 ට පසුව ඇති කුඩාම ඉරට්ට සංඛ්‍යාව කුමක්ද ? (ලකුණු 1)

iii. 30 ත් 95 ත් අතර පිහිටි සමචතුරස්‍ර සංඛ්‍යා සියල්ල ලියන්න. (ලකුණු 1)

iv. අ) හයවන ත්‍රිකෝණ සංඛ්‍යාව (ලකුණු 2)

අ) නවවන සමචතුරස්‍ර සංඛ්‍යාව (ලකුණු 2)

v. 24 හි සියලුම සාධක ලියන්න. (ලකුණු 2)

vi. 30 හා 45 අතර පිහිටි ප්‍රථමක සංඛ්‍යා සියල්ල ලියන්න. (ලකුණු 2)

(6) (a)

i. 24.03

අ) කියවන ආකාරය අකුරින් ලියා දක්වන්න. (ලකුණු 2)



CamScanner

අ) ඉහත සංඛ්‍යාව ගණක රාමුවක නිරූපණය කරන්න. (ලකුණු 2)

ii. අ) 23 . 96
+15 . 08

(ලකුණු 1)

ආ) 38 . 8
- 21 . 95

(ලකුණු 2)

(b) අ)

| $l$ | $ml$ |
|---|---|
| 13 | 795 |
| + 28 | 508 |

(ලකුණු 2)

ආ)

| $l$ | $ml$ |
|---|---|
| 83 | 196 |
| - 54 | 935 |

(ලකුණු 2)

(7)

a) සරල රේඛා ඛණ්ඩ දෙකක් හමුවීමෙන් කෝණ සැදේ.

i. රූපයේ දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරයන් අනුව වඩාත්ම සුදුසු කෝණයේ නම ලියන්න. (ලකුණු 5)




a = ..............................

b = ..............................

c = ..............................

d = ..............................

e = ..............................

(ලකුණු 5)

b) ඝන වස්තුවක් සෑදීමට සකස්කරන ලද පතරමක් පහත දක්වා ඇත.



i. මෙම පතරමෙන් සාදාගත හැකි ඝන වස්තුවේ නම කුමක්ද ? (ලකුණු 1)
ii. එම ඝන වස්තුවේ ඇති දාර ගණන , ශීර්ෂ ගණන , මුහුණත් ගණන ලියන්න. (ලකුණු 3)
iii. ඝනකයක් සෑදීමට සුදුසු පතරමක් ඇඳ දක්වන්න. (ලකුණු 2)



CamScanner

PARCEL NO

# LOL.lk BookStore



# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න




කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**